ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 04/05/2023

පැමිණිලි පාර්ශවය : අසේල බංඩාර යටිවැල්ල මහතා,
අංක. 8/1/1/1, බෝධියංගන මාවත,
මුල්ගම්පොල.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
මහ/කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර.

<u>පැමිණිලි අංකය : HRC/KND/610/22/I</u>

**පැමිණිලි පාර්ශවයේ සැළකිරීම :-**

ඉහත නම් සඳහන් පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම දරුවා වන නේතික දුලීන බංඩාර යටිවැල්ල යන අය 2023 වර්ෂයේ මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කිරිම සඳහා "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය" යටතේ අයදුම්පත් යොමු කරන ලද බවත්, ඒ අනුව කැඳවුම් අංක CO-276 යටතේ 2022.10.25 වන දින පැවැති පළමු සම්මුඛ පරික්ෂණය සඳහා සියළු ලිපිලේඛන සහිතව සහභාගි වූ බවත්ය.

එම සම්මුඛ පරික්ෂණයේදී කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති ඇතුළු සම්මුඛ පරික්ෂණ මණ්ඩලය විසින් තමාගේ සියළු ලේඛන පරික්ෂා කිරිමෙන් පසු ලකුණු 81.6 ක ප්‍රමාණයක් ලබාදෙන ලද බවත්, ඉන්පසු ප්‍රදර්ශනය කරන ලද පාසලට ඇතුළත් කිරිමට සුදුසුකම් ලැබූ දරුවන්ගේ නම් සඳහන් තාවකාලික නාම ලේඛනයෙහි තම දරුවාගේ නම ඇතුළත්ව නොතිබුනු බවත්, පාසලට ඇතුළත් කරගන්නා කඩඉම් ලකුණු ප්‍රමාණය ලකුණු 85 ක් ලෙස දක්වා තිබූ බවත් සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

තමා විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද සියළු ලේඛනවලින් පදිංචි ස්ථානයේ හිමිකම් ඔප්පුව හැර අනෙකුත් සියළුම පදිංචිය සනාථ කරන ලේඛන සඳහා සම්පූර්ණ ලකුණු හිමිව තිබුණද හිමිකම් ඔප්පුව වෙත ලබාදෙන ලකුණු 16 න්(පියාගේ නමට ඇති) ලකුණු 1.6 ක ප්‍රමාණය පමණක් තමාට ලබාදීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය කටයුතු කරන ලද බවත්, ඊට හේතුව තමා පදිංචිව සිටින ඉඩම තමාගේ පියා වන සරත්චන්ද්‍ර කුඩා බණ්ඩාර යටිවැල්ල නමින් තිබුනද එය තම බාල සහෝදරයා විදේශගත රැකියාවක් සඳහා යාමට අවශ්‍ය බැංකු ණයක් ලබාගැනීම වෙනුවෙන් මෙම ඔප්පුව ඔහුගේ නමට පවරා දීම හේතුවෙන් බවත් දක්වා ඇත.

ඉහත කරුණු මත හිමිකම් ඔප්පුව සඳහා පමණක් ලකුණු අඩුවීම හේතුවෙන් තමා විසින් කරනු ලැබූ අභියාචනාවට අනුව 2023.01.18 දින පරීක්ෂණය වෙත ඉදිරිපත් වී තම සහෝදරයා විසින් ලබාගෙන ඇති බැංකු ණය අවසන් කර අංක 277 දරණ විශේෂ ඇටෝනි බලපත්‍රයක් මගින් 2020.10.26 දින නැවත තමාගේ පියාගේ නමට පවරා ඇති ලේඛනයද අභියාචනා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ නමුත් පළමු සම්මුඛ පරීක්ෂණයෙන් ලබාදී තිබූ ලකුණු 81.6 ක ප්‍රමාණයේ වෙනස්වීමක් සිදුනොකළ බවත්, මෙම ඉඩමෙහි ඇති දෙමහල් නිවසේ උඩු මහළ තමා විසින් ඉදිකරගෙන ඊට අදාළ සියලුම බිල්පත් හා අනෙකුත් සියලු දෑ තමාගේ නමින් වෙන්කර ඇති අතර, පසු කාලීනව එම නිවස තමා හට හා සහෝදරයාට වෙන් කිරීමට පියා විසින් තීරණය කර ඇති බවත් දක්වා ඇත. එය සනාථ කර දිවුරුම් ප්‍රකාශයක්ද ලබාදී ඇත.

තම පියාද තමන් ඇතුළු සියළු සහෝදරයන්ද මෙම විද්‍යාලයේ ආදී විද්‍යාර්ථයින්ද වන අතර, තමාගේ නිවසට ආසන්නම හා එකම පිරිමි පාසල මෙම කිංස්වුඩ් විද්‍යාලය වන බැවින්ද, තම දරුවා මෙම පාසලට ඇතුළත් කිරීමට නොහැකි වීමෙන් මානසික වශයෙන් දැඩි පීඩාවට පත්ව සිටින බැවින්ද ඉහත සියළු කරුණු පිළිබඳව අවධානය යොමු කර තමාගේ දරුවා වන "නේතික දුලීන බංඩාර යටිවැල්ල" මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ 2023 පළමු වසර සඳහා ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම් :-**

ඉහත පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශවීය මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිගෙන් 2023.01.31 දාතමින් කරනු ලැබූ ලිඛිත විමසීම ප්‍රකාරව කොමිෂන් සභාව වෙත යොමු කර ඇති ඔහුගේ අංක මහ/කිංස්වුඩ්/04/01/2023 හා 2023.02.14 දිනැති වාර්තාව අනුව, පැමිණිලිකරු විසින් 2023 පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණය සඳහා CO-276 යන යොමු අංකයෙන් ඉදිරිපත් වී පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය ලෙස ඔහුගේ පියාගේ නමින් ඇති ඇටෝනි බලපත්‍රයක් සඳහා ලකුණු ලබාදී ඇති බවත්,

28/2022 චක්‍රලේඛනයට අනුව ඉල්ලුම්කරුගේ මවගේ හෝ පියාගේ නමින් හිමිකම ඇත්නම් ලකුණු 16ක්, අයදුම්පත් ඉදිරිපත් කරන වර්ෂයේ ජුනි 30 දින සිට ආසන්න පූර්ව වර්ෂ 05ක කාලයක් සැළකිල්ලට ගෙන ලකුණු ලබාදිය යුතු නමුත් අයදුම්කරුගේ පියාගේ නමින් ඇති ඇටෝනි බලපත්‍රය වලංගු වන්නේ 2021.10.01 දින සිට බැවින් එම කාලය සලකා 28/2022 චක්‍රලේඛනයට අනුව වර්ෂ 01ට අඩු මාස 06 දක්වා කාලයට ලබාදෙන මුළු

ලකුණු ප්‍රමාණයෙන් 10% ක ලකුණු ප්‍රමාණයක් වන 1.6 ක් ලබාදීමට කටයුතු කළ බවත්, තවද ඔහුගේ පදිංචි නිවසට අදාළ හිමිකම් ඔප්පුව පැමිණිලිකරුගේ සහෝදරයා නමින් ඇති බැවින් පියාගේ නමට ඇති ඇටෝර්නි බලපත්‍රය සඳහා පමණක් ලකුණු ලබාදී ඇති බවත් දක්වා ඇත.

**පරීක්ෂණ හා විමර්ශන කටයුතු වලින් අනාවරණය වන කරුණු :-**

පැමිණිල්ලට අදාළව පැවති මූලික පරීක්ෂණ කටයුතු 2023.02.24 දින පැවති අතර, ඒ සඳහා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති කේ.ඩබ්.ඩී.යූ.චන්ද්‍රකුමාර මහතා, අංශ ප්‍රධානි (ප්‍රාථමික අංශය) ඊ.එම්.ටී.කේ.අමුණුගම මිය හා සහකාර විදුහල්පති ඩී.එස්.ගමගේ යන මහත්ම මහත්මීන් සහ පැමිණිලිකරු වෙනුවෙන් ඔහුගේ බිරිඳ වන එස්.එස්.ජයවර්ධන මහත්මිය සහභාගි වී ඇත. එහිදී පහත කරුණු අනාවරණය වී ඇත.

01. පැමිණිලිකාර අසේල බංඩාර යටිවැල්ල මහතා තම දරුවා වන නේතික දූලීන බණ්ඩාර යටිවැල්ල දරුවා මහ/කිංස්වුඩ් විද්‍යාලයට ඇතුළත් කිරීම සඳහා ‘පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් ගණය’ යටතේ කැඳවුම් අංක CO-276 යටතේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 81.6 ක් ලබාගෙන ඇති බවත්, තත් පාසලේ ආදී ශිෂ්‍යයන්ගේ දරුවන්ගේ ගණය යටතේ කැඳවුම් අංක OB-59 යටතේ අයදුම්කර ලකුණු 29 ක් ලබාගෙන ඇති බවත්,

02. පදිංචිය තහවුරු වන ප්‍රධාන ලේඛනය හැර අනෙකුත් අතිරේක ලේඛනවලට ඡන්දහිමි නාම ලේඛනය හා පාසලට ඇති ආසන්නතාවය සඳහා සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇති බවත්,

03. පැමිණිලිකරුගේ පදිංචි නිවසට අදාළ හිමිකම් ඔප්පුව පැමිණිලිකරුගේ පියා විසින් සහෝදරයාට ණය මුදලක් ලබාගැනීම සඳහා පවරා තිබීම හේතුවෙන් හිමිකම් ඔප්පුව සඳහා ලකුණු අහිමි වී ඇති බවත්, පසුව සහෝදරයා විසින් ඇටෝර්නි බලපත්‍රයක් මඟින් නැවත පියාගේ නමට 2021.10.01 දින පවරා ඇති බැවින් එම කාලසීමාවට අදාළව හිමිකම් ඔප්පුව සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු 1.6 ක් ලබාදී ඇති බවත්,

04. එසේ නමුත් පාසලට ආසන්න පදනම මත ලබාගත යුතු අවම ලකුණු 85ක්ද ආදී ශිෂ්‍ය පදනම මත ලබාගත යුතු අවම ලකුණු 37ක් ද වන බැවින් ඉතාමත් අවාසනාවන්ත ලෙස මෙම ලකුණු උපයා ගැනීමට තිබූ අවස්ථාව පැමිණිලිකරුට මඟහැරී ඇති හෙයින් මෙම පාසලට ඇතුළත්වීමට නොහැකි වී ඇති බවත් මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති විසින් වැඩිදුරටත් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත.

05. එසේම අවසන් නම් ලැයිස්තුව ප්‍රදර්ශනය කිරීමෙන් අනතුරුව පැමිණිලිකරුගේ දරුවාගේ නම ආදී ශිෂ්‍ය ගණයේ පොරොත්තු ලේඛනයේ පමණක් ස්ථානගත කරන ලද්දේ ආසන්න පදනමේ පොරොත්තු ලේඛනයට වඩා එහි ඉදිරියෙන් සිටීම මත බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

නිරීක්ෂණ :-

01. පැමිණිලිකාර අසේල බංඩාර යටිවැල්ල මහතා, අංක 8/1/1/1 හී උපන්දා සිට ස්ථිර පදිංචි අයෙකු බව පැමිණිල්ලේ ලේඛන පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වන බවත්, එසේම මහ/කිංස්වුඩ් විද්‍යාලයේ පළමු ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබා ඇති මොහු එම විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙක් වන අතර, ආදී ශිෂ්‍ය ගණය යටතේ ඔහු "අයදුම්කරු අධ්‍යාපනය ලැබූ කාලසීමාව සඳහා" දෙනු ලබන මුළු ලකුණු 30න් ලකුණු 26ක් ලබාගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

02. එසේම අසේල බංඩාර මහතාගේ නිවසේ සිට මීටර් 200ක පමණ ඉතා කෙටි දුරකින් අදාළ පාසල පිහිටා ඇති අතර, මොහුගේ පියා ඇතුළු පවුලේ සියළු සහෝදරයන් මෙම පාසලේ ආදී විද්‍යාර්ථයින් වන බවත් නිරීක්ෂණය වේ. අනෙකුත් අතිරේක ලිපි ලේඛන පරීක්ෂා කිරීමේදි මෙම පාසලට තම දරුවා ඇතුළත් කිරීමට සියළු සුදුසුකම් ආසන්න පදනම මත සපුරා තිබීම මත කිසිදු සැකයකින් තොරව ආසන්න පදනම මත තමන්ට දරුවා ඇතුළත් කිරීමට හැකියාව ඇති බව සපථ කරගෙන සිටි බැවින් ආදී ශිෂ්‍ය පදනම මත අයදුම් කළද ඊට අදාළ සුදුසුකම් (සාමාජිකත්වය) සපුරා ගැනීමට වැඩි උනන්දුවක් දක්වා නොමැති බව නිරීක්ෂණය වේ.

03. පැමිණිලිකරුගේ ඉඩමේ පිහිටි දෙමහල් නිවසේ උඩුමහලේ බිරිඳ හා දරුවා සමඟ ස්ථිරව පදිංචිව සිටින බවත්, එම කොටස සඳහා වෙන වෙනම වරිපනම්/ජල/විදුලිය තමා නමින් වෙන්කර ගෙන ඇති නමුත් මෙම ඉඩමේ අයිතිය පැමිණිලිකරුගේ පියාගේ නමින් ඇති බවත් නිරීක්ෂණය වේ.

04. පියා සතු ඉඩමේ ඔප්පුව පැමිණිලිකාර අසේල බංඩාර යටිවැල්ල මහතාගේ සොහොයුරා වන නිමේෂ් නිමල් බංඩාර යටිවැල්ල යන අයගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා විදේශගත වීම සඳහා තාවකාලික බැංකු ණයක් ලබාගැනීමට පමණක් 2017.04.28 දින ඔහු වෙත ඉඩම පවරා දී නැවත එය 2021.10.01 දින විශේෂ ඇටෝර්නි බලපත්‍රයක් මඟින් ආපසු තම පියා වෙත පවරාදී ඇත. පැමිණිලිකරු විදේශගත රැකියාවක නිරත වී සිටියදී මෙම පවරාදීම සම්බන්ධයෙන් පැමිණිලිකරු දැනුවත් වී නොසිටි බව නිරීක්ෂණය වේ. පියා විසින් එම පවරා දෙන අවස්ථාවේදී ද මෙම පැමිණිලිකරු එම නිවසේ පදිංචි ව සිට ඇති බවද, ලේඛන මඟින් තවදුරටත් නිරීක්ෂණය වේ.

05. ඉඩමේ අයිතිය පියා සතු වන අතර, ඔහු විසින් තම සොහොයුරාගේ අභිවෘද්ධිය ගැන සලකා කටයුතු කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරු වන අසේල බණ්ඩාර යටිවැල්ල යන අයට විරුද්ධ වීමට සාදාචාරාත්මක හැකියාවක් නොපවතින අතර, මේ පිළිබඳව පියා විසින් මොහුව දැනුවත් නොකිරීම තුළින් විකල්ප ක්‍රියාමාර්ගයකට එළඹීමට ඇති අවස්ථාව අහිමිවීමෙන් ඔහුගේ දරුවාට මෙම පාසලට ඇතුළත්වීම සඳහා ප්‍රමාණවත් ලකුණු උපයා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ.

06. පාසලට ඇතුළත් වීම සඳහා ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් ගණය සඳහා කඩඉම් ලකුණු ප්‍රමාණය 85ක්ද, ආදි ශිෂ්‍ය ගණය යටතේ කඩඉම් ලකුණු 36 ක්ද වන බව නිරීක්ෂණය වන අතර, 28/2022 චක්‍රලේඛනයේ අංක 7.2.1.1 (II) පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය වන ඉඩමේ ඔප්පුව පැමිණිලිකාර අසේල යටිවැල්ල මහතාගේ පියාගේ නමින් තිබී ඇති බැවින් ඉහත කරුණු යටතේ ලකුණු අහිමි වීම නිසා ඒ සඳහා ඔහුට ලැබිය යුතු ලකුණු ප්‍රමාණය වන ලකුණු 16 අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ. එකී ලකුණු හා එක්ව ගත්කල මොහුට ලැබෙන සමස්ථ ලකුණු ප්‍රමාණය ලකුණු 96 ක් වන අතර, එසේ වූවානම් මොහු තෝරාගැනීම් ලැයිස්තුවේ ඉදිරියෙන්ම සිටින බව නිරීක්ෂණය වේ.

පාසලට ආසන්නතාවය මත ඉදිරිපත් වී ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු

| විස්තර | චක්‍රලේඛණානුකූලව ලැබිය යුතු ලකුණු | ප්‍රථම සම්මුඛ පරීක්ෂණ ලකුණු |
|---|---|---|
| පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන/ වෙනත් ලේඛන | 20 | 1.6 |
| පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන | 05 | 05 |
| ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය | 25 | 25 |
| පාසලට ඇති ආසන්නතාවය | 50 | 50 |
| එකතුව | 100 | 81.6 |

07. පැමිණිලිකරුගේ පදිංචිය පිළිබඳ යම් ගැටළුවක් ඇත්නම් භෞතිකව පදිංචිය සනාථ කරගැනීම සඳහා චක්‍රලේඛනයේ 9.3.3 අනුව ස්ථානීය පරීක්ෂණයක් සිදුකළ යුතු වුවද ප්‍රථම සම්මුඛ පරීක්ෂණය හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලයද එසේ කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ.

08. පැමිණිලිකරු මුළු ලකුණු 81.6 ලබාගෙන ඇති අතර, ඒ අනුව මොහු පොරොත්තු ලේඛනයේ අංක 10 ස්ථානගත කළ යුතු වුවද එසේ කටයුතු නොකර ලකුණු 81ක් ලබාගත් අයවලුන් දෙදෙනෙකු 10 හා 11 යන ස්ථානවල ස්ථානගත කිරීම තුළින්ද පැමිණිලිකරුට අසාධාරණයක් සිදුව ඇති බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

01. පැමිණිලිකාර අසේල බණ්ඩාර යටිවැල්ල මහතා 2023 පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කරගැනීමේ චක්‍රලේඛනයට අනුව ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ CO-276 තම දරුවා වන නේතික දුලින බණ්ඩාර දරුවා ඇතුළත් කරගැනීමට අයදුම්කර සම්මුඛ පරීක්ෂණය සඳහාද පෙනී සිට ඇත.

02. පාසලට ළමුන් ඇතුළත් කරගැනීමේ චක්‍රලේඛ අංක 28/2022 අනුව ඉල්ලුම්කරුගේ මව/පියා ගේ නමින් ඉඩමේ හිමිකම මත ලකුණු 16ක් හිමිවනු ඇත. එනමුත් පැමිණිලිකරුගේ පියා විසින් කිසිදු දැනුම් දීමකින්

තොරව තම සොහොයුරාට මෙම ඉඩම පවරා දීමෙන් ලැබිය යුතු ලකුණු 16 ක ප්‍රමාණය අහිමි වී ඇත. අනතුරුව සොහොයුරා විසින් පියා වෙත එකී ඉඩම යළි පවරාදී ඇත්තේ වසර 1 ½ කට පමණ පසුවය. ඒ අනුව පැමිණිලිකරු වෙත හිමිකම් ඔප්පුව සඳහා ලකුණු 1.6 ක් හිමිවී ඇත.

03. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති ලේඛන අනුව උපන්දා සිට මුල්ගම්පල, බෝධියංගන මාවතේ, අංක 8/1/1/1 හි ස්ථිර පදිංචි පැමිණිලිකාර අසේල යටිවැල්ල මහතාද ඔහුගේ පියා මෙන්ම සහෝදරයන්ද අධ්‍යාපනය හැදෑරූ ආසන්නම පාසල වන මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීමට ඔහුගේ දරුවා වන නේතික දූලින බණ්ඩාර යටිවැල්ල යන දරුවාට ද සාධාරණ අයිතියක් ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

04. එසේම චක්‍රලේඛානානුකූලව පදිංචිය සනාථ කිරීමට ඉදිරිපත් කරන ප්‍රධාන ලේඛනයට හිමි ලකුණු ප්‍රමාණය අහිමි වීම කිසිවෙකු විසින් හිතාමාතා සිදුකරන ලද ක්‍රියාවකින් සිදුවූවක් බව අනාවරණය නොවන අතර, එම ක්‍රියාදාමය තුළ කූට ලේඛන සැකසීමක් හෝ කිසිඳු වංචනික ක්‍රියාවක් සිදුකර ඇති බව අනාවරණය නොවන බව නිගමනය කරනු ලැබේ.

05. ඡන්ද හිමි ලේඛනය, අතිරේක ලේඛන ආසන්නතාවයට හිමි සම්පූර්ණ ලකුණු ප්‍රමාණය ලැබුනද සාධාරණ නොවූ ඉහත හේතු මත ප්‍රමාණවත් ලකුණු අහිමි වීම තුළින් මහනුවර කිංස්වුඩ් විද්‍යාලයට නේතික දූලින යටිවැල්ල දරුවාට ඇතුළත් වීමට අවස්ථාව අහිමි වීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති නිදහස් අධ්‍යාපනය ලැබීමේ ඇති අයිතිය හා එම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) වගන්තිය මඟින් සහතික කොට ඇති නීතිය ඉදිරියේ සමාන ලෙස සැළකිම ලැබීමට ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. පැමිණිලිකරුගේ දරුවා වන නේතික දූලින බණ්ඩාර යටිවැල්ල දරුවා 2023 වර්ෂයේ මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කළයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී/අභියාචනා අවස්ථාවේදි අදාළ විදුහල්පතිවරයාට/අභියාචනා මණ්ඩල සභාපතිවරයාට සාධාරණ හේතු පදනම් කරගෙන තම අභිමතය පරිදි කටයුතු කර මෙලෙස අසාධාරණයන්ට ලක්වූ දරුවන්ට සහන සැළසීම සඳහා අවස්ථාව සලසාදීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (3) (ඇ) වගන්තියට අනුව ඇති බලතල ප්‍රකාරව අදාල නීතිමය ප්‍රතිපාදන පාසලට ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛනයට ඇතුළත් කළ යුතු බවට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

වෙත නිර්දේශ කරනු ලැබේ. එසේ කටයුතු කිරීමෙන් සුදුසුකම් සපුරා ඇති අසාධාරණයට ලක්වන දරුවන් මෙන්ම දෙමාපියන්ට නීතිමය තත්වයන් තුළ ඇති වන අනවශ්‍ය ප්‍රමාදයන් හා අත්විඳින මානසික පීඩාවන්, ආර්ථික අපහසුතාද වළක්වා ගැනීමට පිටුවහලක් වනු ඇත.

2023.06.05 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,

හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,

සභාපතිනි,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

අනුසූයා ෂන්මුගනාදන්,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

පිටපත් - 01. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය , බත්තරමුල්ල.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය , බත්තරමුල්ල.

03. ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරී,
ප්‍රාදේශීය කාර්යාලය,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව - මහනුවර.